# පුල් එළිය ග්‍රාමයෙහි ජනජීවිතය හා සබැඳි චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ සමාජ මානවවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්.ඒ.අයි.එල්. රාජපක්ෂ[1], කේ.ඒ.ජේ.ඩී. කස්තුරිආරච්චි[2]

ඕනෑම සමාජයක වත්පිළිවෙත් නමින් හඳුන්වන සමාජ හැසිරීම් ඇත. මෙලෙස පුද්ගල ජීවිතය සරුකර ගැනීම උදෙසා මිනිසා විසින්ම නිර්මාණය කරගත් විවිධ වූ චාරිත්‍ර වාරිත්‍ර හා ආගමික හෝ යම් ඇදහීම් මෙන්ම අභිචාර විධික්‍රම හඳුනාගත හැකිය. පුල්එළිය ආශ්‍රිතව සිදුකරන ලද මෙම අධ්‍යයනයේ තුළ පර්යේෂණ ගැටළුව වශයෙන් පුල්එළිය ග්‍රාමයෙහි ජන ජීවිතය හා සබැඳි චාරිත්‍ර වාරිත්‍ර මොනවාද? යන්න සොයා බැලීම හා එම චාරිත්‍ර වාරිත්‍ර ග්‍රාමීය සමාජ ක්‍රමයේ පැවැත්මට හේතු වූ ආකාරය සොයා බැලීම අරමුණු විය. නව්‍යකරණයේ බලපෑම සමඟ මෙකී චාරිත්‍ර වාරිත්‍ර වෙනස්වීමට බලපෑ හේතු සාධක අධ්‍යයන උප අරමුණු වූ අතර එහිලා අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුල්එළිය ග්‍රාමය පර්යේෂණ ක්ෂේත්‍රය කරගනිමින් ද්විතියික දත්ත රැස්කිරීම පොතපත මඟින්ද ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා සමීක්ෂණය හා සිද්ධි අධ්‍යයනය යන ක්‍රම භාවිත කරන ලදි. එම ක්‍රම යටතේ සහභාගීත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා තුළින් දත්ත ලබාගැනීමේ ක්‍රමවේදය වශයෙන් භාවිත කෙරුණි. එහි දී කෘෂිකාර්මික රටාව, විවාහ ක්‍රමය, වරිග සංවිධානය ආශ්‍රිත පාලන ක්‍රියාවලිය හා ජන ජීවිතය හා බැඳි සංස්කෘතිය මඟින් චාරිත්‍ර වාරිත්‍රවල සමාජීය පැවැත්ම සඳහා පදනම ගොඩනැගී ඇති ආකාරය අධ්‍යයනය තුළින් විමර්ශනය කරන ලදි. සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමය හා පදනම්ව වූ කෘෂිකාර්මික රටාව මත පැවැති වෙල්යායේ කාර්යය සන්නිවේදනය සඳහා තහංචි බැඳීමේ චාරිත්‍රය, ගම්භාර දෙවියන් පිදීම වෙනුවෙන් අක්යාල් වෙන් කිරීම, පුල්ලෙයාර් දෙවියන් උදෙසා වූ විවෘත දෙවොලකදී පැවැත්වෙන පූජා කර්මයන්, පාළු ගොවිබිම් නැවත සශ්‍රික කිරීම වෙනුවෙන් යකුන්ට හා බහිරවයන්ට දොළ පිදේනි ලබාදීම වෙල්යාය සකස්කර ගැනීමේ සිට අස්වනු ලබාගැනීම දක්වා ක්‍රියාත්මක චාරිත්‍ර වාරිත්‍ර විධි ලෙස හඳුනාගත හැකිය. විවාහ ක්‍රමය තුළ පොදු විවාහ නීතියට අනුගත වීමේ චාරිත්‍රය තුළ ස්ව කැමැත්තෙන් පිරිමියෙකු හට ආහාර පිසින්නේ නම් එහි අර්ථය ඔහු ස්වාමියා වශයෙන් පිළිගැනීමේ චාරිත්‍රය මෙන්ම ඇවැස්ස නෑනා මස්සිනා විවාහයේ දී පරමාදර්ශී පවුල් ඒකකය තුළ අනුගත චාරිත්‍ර ද එසේම විවාහය තුළ දී මස්සිනාවරුන් එකම නිවසක් තුළ ජීවත් වීමට තවකෙකු බිත්න බැසීමේ චාරිත්‍රය ද වරිග සංවිධානය හා බැඳි පරිපාලන රටාව තුළ නායකයින් පත්කර ගැනීමේ දී හොඳ හඳහනක් ඇති අයෙකු තේරීමේ ඇතුළු චාරිත්‍රයන් රාශියක් පර්යේෂණයෙන් සොයා ගැණුනි. පුල්එළිය ග්‍රාමයෙහි මෙකී චාරිත්‍ර ග්‍රාමීය සමාජ ක්‍රමයේ පැවැත්මට හේතු වූ ආකාරය හා චරිත්‍රවල වෙනස්වීම සමාජ නවීකරණය මඟින් එහි අනන්‍යතාව ක්‍රමිකව අභිමිවී යන ආකාරය සමාජ පරිණාමී ක්‍රියාවලියේ පොදු මූලධර්මතාවක් බව මෙම අධ්‍යයනය මඟින් නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : චාරිත්‍ර වාරිත්‍ර, විවාහ, වරිග, ජන ජීවිතය

---

[1] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. isharalak08@gmail.com

[2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය